3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,163,000	1,158,000	1,131,410	98%
ප්‍රාග්ධන	342,000	347,000	338,123	98%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනය අරමුණ (පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන ලබා දීම)	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (274)	පුනරාවර්ථන	-	1,148,535,000.00	1,117,658,170.68	97.31
		ප්‍රාග්ධන	-	356,465,000.00	347,588,655.20	97.51
2	ජනාධිපති කාර්යාලය (001)	පුනරාවර්ථන	-	1,685,000.00	1,680,000.00	99.70
3	බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය (101)	පුනරාවර්ථන	-	3,929,005.00	3,910,630.00	99.53
		ප්‍රාග්ධන	-	7,005,366.17	6,506,927.06	92.88
4	ආරක්ෂක අමාත්‍යාංශය (103)	පුනරාවර්ථන	-	1,288,766.00	1,038,766.00	80.60
		ප්‍රාග්ධන	-	5,400,201.50	5,395,055.00	99.90
5	අධිකරණ අමාත්‍යාංශය (110)	ප්‍රාග්ධන	-	1,499,500.00	1,223,359.50	81.58
6	වෙළඳ අමාත්‍යාංශය (116)	ප්‍රාග්ධන	-	800,000.00	795,459.00	99.43
7	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය (117)	ප්‍රාග්ධන	-	22,140,642.20	22,140,641.71	100.00
8	කෘෂිකර්ම අමාත්‍යාංශය (118)	පුනරාවර්ථන	-	1,352,634,200.00	137,837.95	0.01
		ප්‍රාග්ධන	-	13,835,332.50	13,617,949.53	98.43
9	ඉඩම් අමාත්‍යාංශය (122)	ප්‍රාග්ධන	-	1,947,588.16	1,947,588.16	100.00
10	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය (123)	ප්‍රාග්ධන	-	2,061,547.07	2,061,547.07	100.00
11	කර්මාන්ත අමාත්‍යාංශය (126)	ප්‍රාග්ධන	-	2,296,597.40	2,150,430.65	93.64
12	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (130)	පුනරාවර්ථන	-	762,907.15	753,335.20	98.75
		ප්‍රාග්ධන	-	11,365,127.86	11,306,779.44	99.49
13	වැවිලි අමාත්‍යාංශය (135)	ප්‍රාග්ධන	-	11,440.00	11,440.00	100.00

14	කර්මාන්ත අමාත්‍යාංශය (149)	ප්‍රාග්ධන	-	26,558,070.58	24,979,826.07	94.06
15	පරිසර අමාත්‍යාංශය (160)	ප්‍රාග්ධන	-	3,978,000.00	3,506,930.00	88.16
16	කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය (171)	පුනරාවර්ථන	-	1,207,441,632.65	1,197,912,212.65	99.21
		ප්‍රාග්ධන	-	231,266,747.71	224,171,258.25	96.93
17	තාක්ෂණ අමාත්‍යාංශය (186)	ප්‍රාග්ධන	-	1,195,775.00	987,907.81	82.62
18	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (193)	ප්‍රාග්ධන	-	238,050.00	238,050.00	100.00
19	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය (194)	ප්‍රාග්ධන	-	8,828,432.00	7,280,640.11	82.47
20	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව (201)	පුනරාවර්ථන	-	27,013,520.00	24,595,863.74	91.05
		ප්‍රාග්ධන	-	2,090,250.00	2,048,547.99	98.00
21	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (202)	ප්‍රාග්ධන	-	400,000.00	400,000.00	100.00
22	සංස්කෘතික කටයුතු දෙපාර්තමේනතුව (206)	පුනරාවර්ථන	-	5,089,700.00	4,836,687.15	95.03
		ප්‍රාග්ධන	-	3,004,421.00	3,004,421.00	100.00
23	සමාජ සේවා දෙපාර්තමේන්තුව (216)	පුනරාවර්ථන	-	992,180.00	857,910.81	86.47
		ප්‍රාග්ධන	-	518,311.50	447,732.50	86.38
24	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (217)	ප්‍රාග්ධන	-	2,170,800.00	2,126,944.80	97.98
25	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව (216)	පුනරාවර්ථන	-	803,700.00	723,100.00	89.97
26	ආයුර්වේද දෙපාර්තමේන්තුව (220)	ප්‍රාග්ධන	-	2,024,246.79	1,994,446.56	98.53
27	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව (237)	ප්‍රාග්ධන	-	11,256,300.00	10,907,721.60	96.90
28	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව (243)	පුනරාවර්ථන	-	13,200,000.00	4,285,745.01	32.47
29	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව (248)	ප්‍රාග්ධන	-	4,258,823.99	4,218,457.05	99.05
30	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු (254)	ප්‍රාග්ධන	-	861,763.60	859,029.30	99.68
31	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව (282)	ප්‍රාග්ධන	-	5,653,288.40	5,090,138.99	90.04
32	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (284)	පුනරාවර්ථන	-	16,330,126.65	15,814,643.23	96.84
		ප්‍රාග්ධන	-	110,025.00	110,025.00	100.00

33	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (304)	ප්‍රාග්ධන	-	984,105.08	984,105.08	100.00
34	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (307)	ප්‍රාග්ධන	-	3,866,217.00	3,834,558.44	99.18
35	ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව (326)	ප්‍රාග්ධන	-	786,582.00	702,304.67	89.29
36	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව (327)	ප්‍රාග්ධන	-	871,590.00	760,369.00	87.24
37	මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව (328)	ප්‍රාග්ධන	-	418,770.00	161,753.80	38.63
	එකතුව		**-**	**4,515,874,649.96**	**3,087,765,902.76**	**68.38**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණ -යට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	990,237.00	990,237.00	-	100%
9152	යන්ත්‍රෝපකරණ	487,881.00	487,881.00	-	100%
9153	ඉඩම්	2,376,103.00	2,376,103.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	372,724.00	372,724.00	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NCCG/AN/A/DSAP/2023/08

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 31 දින.

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුර.

ශීර්ෂය - 274 අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සමපිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 274 අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇනිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) භාණ්ඩාගාර මුදිත සටහන් සහ ඒසීඒ 5 ආකෘති පත්‍රය ප්‍රකාරව අත්තිකාරම් ලැබීම් ශේෂය රු.74,874,530 ක් වුවත් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ එම අගය රු.103,266,952 ක් ලෙස දැක්වීම් හේතුවෙන් ආදායම් නොවන ලැබීම් රු.28,392,422 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර මුදිත සටහන් ප්‍රකාරව අත්තිකාරම් ගෙවීම් වර්තාකම් රු.67,653,680 ක් වුවත්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි එකී අගය රු.105,794,116 ක් ලෙස දැක්වීම හේතුවෙන් ප්‍රධාන ලෙජර් වියදම් රු.38,140,436 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වෙනත් දෙපාර්තමේන්තු විසින් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් දරන ලද රු.4,286,928 ක වියදම් මූදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් නොකළයුතු වුවත් මූදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි සහ මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි.

(ආ) වැය විෂය අංක 2401, 2509 හා මූලධන වත්කම් පුනරුත්ථාපන සහ වැඩි දියුණු කිරීම් (2001,2002,2003) වැය විෂයයන් වෙනුවෙන් දරන ලද රු.199,956,036 ක් මූදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි සහ අනෙකුත් මෙහෙයුම් වියදම් යටතේ දක්වා නොතිබුණි.

1.6.3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.5 වගන්තිය ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වර්ෂ අවසානයේ ශේෂය අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයේ සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු වුවත් එකී ශේෂ දෙක අතර රු.10,567,936 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ගණනය කිරීම් අනුව අනෙකුත් ගිර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද බැර කිරීම් රු. 10,706,878 ක් වුවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එම අගය රු.38,737,436 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.28,030,538 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ගණනය කිරීම් අනුව අනෙකුත් ශීර්ෂ වියින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද හර කිරීම් රු.584,500 ක් වූවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එම අගය රු.39,520,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.38,935,500 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඒකාබද්ධ ශේෂ පිරික්සුම් අනුව අනෙකුත් ශීර්ෂ වෙතුවෙන් වාර්තාකරණ ආයතනය වියින් අත්තිකාරම් බී ගිණුම් වෙතුවෙන් වාර්තා කරන ලද බැර කිරීම් රු.39,520,000 ක් වූවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.10,855,021 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.28,664,979 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ඒකාබද්ධ ශේෂ පිරික්සුම් අනුව වාර්තාකරණ ආයතනය වියින් අත්තිකාරම් බී ගිණුම් වෙතුවෙන් කරන ලද හර කිරීම් රු.38,987,436 ක් වූවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.7,077,272 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.31,910,164 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.4 **අග්‍රිම ශේෂය**

භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.7,767,350 ක් වූවත් ACA 3 ආකෘතියේ භාණ්ඩාගාර පොත් අනුව ශේෂය දැක්වීමේ තිරුවයටතේ එම අගය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය තිරුවේ දක්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මුදලින් සහ වියදම් මඟින් අග්‍රිම පියවීම් එකතුව භාණ්ඩාගාර මුද්‍රිත අනුව රු.5,637,849,213 ක් වූවත් ACA 3 ආකෘතිය ප්‍රකාරව රු.5,645,581,089 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ශේෂ දෙක අතර රු.7,767,350 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වියින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙතුවෙන් අමාත්‍යාංශ 21 ක් හා දෙපාර්තමේන්තු 25 ක් වියින් පිළිවෙලින් රු.මිලියන 3896 ක් හා රුපියල් මිලියන 981 ක් ලෙස එකතුව රු.මිලියන 4877 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 3297 ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 1580 ක් හෙවත් සියයට 32 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය තුළ වියදම් දැරීම සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් සියයට 97 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. දෙපාර්තමේන්තු 02 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළ වියදම් දැරීම සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 31 ක් සහ සියයට 67 ක් ලෙස ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිර්දිති රෙගුලාසිවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	චෝදනාකම් රු.	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.5 වගන්තිය		රජයේ නිවාසවල පදිංචි බදු කාලය අවසන් වූ පසු අදාල නිලධාරියා නිවාසයෙන් අස් වී යා යුතු වුවත් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව පවතින නිවාස 08 ක බදු කාලය වසර 05 ඉක්මවා නිසියදීන් නිවාස ලබාගත් නිලධාරීන් අදාල නිවසවල රැඳී සිටින බවත් ඒ තුලින් රජයේ නිවාස අපේක්ෂාවෙන් පොරොත්තු ලේඛනයේ රැඳී සිටින නිලධාරීන්ට අවස්ථාව අහිමි වී යන බවත් විගණනයේදී නිරීක්ෂණය විය.
(ආ) 1994 අගෝස්තු 03 දිනැති 26/92 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ		දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු සංචිත වාහන 04 ක රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම සලකුණු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය.

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පදිංචි සහ හොවිතැන් කටයුතු වල නියැලී ඉඩම් නොමැති අය සඳහා ඉඩම් ලබාදීමට හා දැනට ඉඩම් හිමි එහෙත් නීත්‍යානුකූල අයිතිය නොමැති අය සඳහා විධිමත් බලපත්‍ර ලබාදීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කළමනාකරණය විධිමත් කිරීම සඳහා වූ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමට කටයුතු කළයුතු වුවත් වසර 03 කට හෝ ඊට වැඩි කාලයක සිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 ක ඉඩම් කච්චේරි පවත්වා නොතිබුණි.

(ආ) 2021 වර්ෂයේ පැවැති ඉඩම් කච්චේරි අනුව ගල්නැව,පලාගල,කැකිරාව සහ මිහින්තලේ යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල ග්‍රාම සේවා වසම් 17 ක බලපත්‍ර ලබාදීම අවසන් නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ ගාස්තු වශයෙන් 2017 දෙසැම්බර් 31 දින උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙතින් පලුගස්වැව ප්‍රාදේශිය ලේකම් වෙත ලද රු.8,000,000 ක මුදල් විගණන දින වූ 2022 දෙසැම්බර් 08 වන විටත් වසර 05 කට ආසන්න කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් පවරාදීමේ කටයුතු වර්ෂ 05 ක් තිස්සේ සිදු කර එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ඈ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩ සටහන - 2021 යටතේ නිදැලි බිත්තර කුකුළු පැටවුන් මිලදී ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මැදවිච්චිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන වෙන්කර දී තිබුණි. එහෙත් ප්‍රතිලාභීන් වෙත කුකුළු පැටවුන් ලබා දී නොතිබුණු මුදල් රු.596,352 ක් වූ අතර එම මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

3..1.2 **අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කෙරේ.

(අ) 2021 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ කහටගස්දිගිලිය කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී තුලාන 04 ක ප්‍රතිලාභීන් 134 දෙනෙකු වෙත කුකුළු පැටවුන් 3828 ක් ලබාදී ඇතත්, ප්‍රගති වාර්තා අනුව ඉන් සියයට 20 ක් පමණ විවිධ රෝග හේතුවෙන් මියගොස් තිබුණි. එහි වටිනාකම රු.435,000 ක් වූ අතර ප්‍රතිලාභීන් 12 දෙනකු වෙත ලබාදුන් සියලු කුකුළු පැටවුන් මිය ගොස් තිබුණි.

(ආ) මැදවිච්චිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 153 දෙනකු සඳහා කුකුළු පැටවු 17433 ක් ලබාදී තිබූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට ඉන් ජීවතුන් අතර සිටින කුකුළු පැටව් සංඛ්‍යාව 5862 ක් වූ අතර එය ලබාදුන් පැටව් ප්‍රමාණයෙන් සියයට 34 ක් තරම් අඩු ප්‍රතිශතයකි. ඒ අනුව අදාල වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

3.1.3 **අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබානොගැනීම**

ප්‍රාදේශිය ලේකම් කාර්යාල 12 ක ග්‍රාම ශක්ති සමිති 143 ක් අතරින් සමිති 92 ක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි. එම අක්‍රිය සමිති ඇතුළත් සමිතිවල 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 77,609,867 ක මුදල් ශේෂයක් පැවතුණි.

3.1.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

(අ) මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර 02 යටතේ සිදු කර තිබූ ඉදිකිරීම් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.

(i) මිල හා ප්‍රමාණ පත්‍රයේ (BOQ) වැඩ අයිතම අංක 2 C – 3 සහ 2 C – 4 යන වැඩ අයිතමයන් ඉටු කිරීමේදී 300 mm x 600 mm ප්‍රමාණයේ "homogeneous glazed ceramic wall tile" යන අපේක්ෂිත පිරිවිතරයන්ට අනුව සපයා සවිකර නොනිබියදී එම පිරිවිතරවලට අදාල රේටයන් පදනම් කර ගනිමින් වර්ග මීටර් 425 ක් සඳහා රු.2,635,020 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) මිල සහ ප්‍රමාණ පත්‍රයේ (BOQ) වැඩ අයිතම අංක 2 C – 5 සහ 2 C – 6 යන වැඩ අයිතමයන් ඉටු කිරීමේදී "Variation order 7.2'' යටතේ සහ (BOQ) වැඩ අයිතම 2 C– 5 සහ 2 C– 6 යටතේ වර්ග මීටර් 13.33 කට අධි ගෙවීමක් නිරීක්ෂණය විය.

(iii) මිල සහ ප්‍රමාණ පත්‍රයේ (BOQ) වැඩ අයිතම 2H – 03 ට අදාලව සපයා තිබුණු රු.42,572 ක් වූ ඉනිමහවල් 02 න් අඩි 4 x 3 ප්‍රමාණයේ බහු කාර්යය ඉනිමග ප්‍රාදේශිය ලේකම් කාර්යාල පරිශ්‍රයෙන් අස්ථාන ගත වී තිබුණි.

(iv) මිල සහ ප්‍රමාණ පත්‍රයේ (BOQ) වැඩ අයිතම අංක 2H -02 ට අදාලව කොන්ක්‍රීට් කාණු ඉදිකිරීමේදී දිග මීටර් 170.08 ට ගෙවීම් කර තිබුණද, සත්‍ය වැඩ ප්‍රමාණය දිග මීටර් 168.18 ක් වූ බැවින් දිග මීටර් 1.9 කට රු.21,490 ක් අධි ගෙවීමක් නිරීක්ෂණය විය.

(ආ) අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාත්මක සුභ සාධක සංගමය සමඟ වූ ගිවිසුමට ප්‍රකාරව තිසාවැව අංක 14 රජයේ නිල නිවස අලුත් වැඩියා කිරීම සඳහා රු.976,602 ක් ගෙවීම් කර තිබුණු අතර මිල සහ ප්‍රමාණ පත්‍රයේ (BOQ) වැඩ අයිතම අංක 7.1, 7.2 සහ අමතර වැඩ අයිතම 03 ට අදාල කාර්යයන් ඉටු කිරීමේදී වැඩ විස්තරයේ ඇතුළත් කාර්යයන් 03 ක් සිදු කර නොනිබියදී මිනුම්පත් මඟින් එම වැඩ අයිතම සිදු කළ බවට අධීක්ෂණ නිලධාරීන් විසින් කර තිබූ නිර්දේශය පදනම් කරගෙන වැඩ අයිතම 03 ට අදාල රු.119,292 ක් වූ මුළු මුදලම ගෙවීම් කර තිබුණි. එම නිසා මෙම ගෙවීම් තුල ඉටු නොකරන ලද කාර්යයන් 07 ට ගෙවීමක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) සෘජු කොන්ත්‍රාත් පදනම මත ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකමට ප්‍රදානය කර තිබූ ඉහත (ආ) ඡේදයේ කොන්ත්‍රාත්තුවේ ගෙවීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු ඇස්තමේන්තු මිල රේටියන් අනුව සිදු කර තිබුණු නමුත් අමතර වැඩ අයිතම 02 සඳහා පමණක් ටයිල් ඇතිරීම වර්ග මීටර් 8.17 කට කොන්ත්‍රාත්කාර ප්‍රශා පාදන සංවිධානය වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුභ සාධන සංගමයේ මිල විශ්ලේෂයක් මත රු.118,000 ක් ගෙවීම් කිරීම නිසා 2022 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිල රේටියන්ට සාපේක්ෂව මෙම වැඩ අයිතමය සඳහා රු.24,298 ක අධි ගෙවීමක් නිරීක්ෂණය විය.

3.2 වත්කම් කළමනාකරණය

2017.11.13 දින දිස්ත්‍රික් ලේකම් වෙතින් ගලෙන්බිදුණුවැව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ලබා දෙන ලද අංක 340382 දරන A3 Duplex මුද්‍රණ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අදාල ටෝනර් සහ අනෙකුත් අඩංගු කොටස් ලැබී නොමැතිවීම හේතුවෙන් විගණන දින වූ 2022 සැප්තැම්බර් 29 වන විට වසර 05 කට ආසන්න කාලයක් ගත වී තිබුණද එම මුද්‍රණ යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) රජයේ කළුගල් කැණීම් මත රජයේ ගාස්තු අයකිරීම පරීක්ෂාව

ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශය තුළ රජයේ ඉඩම්වල කළුගල් කැණීම් වෙනුවෙන් රජයේ ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාවේදී සුපුරුදු ද්‍රව්‍ය පාලක විසින් නිකුත් කරන ලද සුපුරුදු ද්‍රව්‍ය බලපත්‍ර සහ භූ විද්‍යා හා පතල් කාර්යාංශය නිකුත් කළ කැණීම් බලපත්‍ර පදනම් කරගෙන භූ විද්‍යා හා සමීක්ෂණ කාර්යාංශය විසින් රාජ්‍ය ආදායම අයකර තිබුණි. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය වෙත රාජ්‍ය ආදායම ගෙවන ලද කියුබ් ප්‍රමාණයන් හා සැසඳීමේදී ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09 ක රු.147,298,661 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දින වන විට අයකරගත යුතුව පැවතුණි. විස්තර ඇමුණුම් 01 හි දැක්වේ.

(අ) බොරළු කැණීම් මත අයවිය යුතු මිහ ගාස්තු

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02 ක 2019-2022 වසරවලට අදාල බොරළු කැණීම් සිදු කර අවසන් කර ඇති නමුත් විගණන දින වූ 2022 දෙසැම්බර් 31 දින වන විටත් කැණීම් සිදුකල පුද්ගලයන් විසින් කැණීම් කරන ලද මුළු කියුබ් ප්‍රමාණයන්ට අදාලව රජයේ ගාස්තු ගෙවීමට කටයුතු කර නොතිබූ අතර එකතුව රු.10,045,440 ක මිහ මුදලක් අයවීමට තිබුණි.

(ආ) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය ක්‍රියාත්මක කරන ණය වැඩ සටහන්වල ප්‍රගතිය පරීක්ෂාව

එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වනිතා සංවර්ධන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රම 06 කට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක 2022.12.31 දිනට රු. 2,833,192 මුදලක් වසර 03 ට වඩා වැඩි කාලයක සිට දිගින් දිගටම මිහ ණය ලෙස පැවතුණි. විස්තර ඇමුණුම් 02 හි දැක්වේ.

(ඇ) දීර්ඝකාලීන බදු පදනම මත ලබාදී ඇති රජයේ ඉඩම් වලින් බදු අයකර ගැනීමේ අකාර්යක්ෂමතාවයක් දක්නට ලැබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 174,128,248 ක මිහ බදු අයවිය යුතුව පැවතුණි.

(ඉ) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කෘෂි කාර්මික කටයුතු හා නේවාසික කටයුතු සඳහා ලබාදී ඇති දීමනා පත්‍ර හිමිකරුවන් විසින් විවිධ සමාගම් වෙත සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම් සඳහා වාණිජ කාර්යයන් වෙනුවෙන් භාවිතා කිරීමට එම ඉඩම්වලින් කොටසක් බැහැර කර ඇති අවස්ථාවලදී, 2020 පෙබරවාරි 06 දිනැති අංක 2020/02 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍රවල පසු කටයුතු මැයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව අදාල දීමනා පත්‍ර රජයට භාරගෙන ඉහත කී චක්‍රලේඛයේ VI කොටසෙහි උපදෙස් අනුව කටයුතු කළයුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක පිහිටි සන්නිවේදන කුළුණු 126 ක් සම්බන්ධයෙන් ඉහත කී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ ලබාදුන් වසර 03 ත් 06 ත් අතර පැවති රු.751,729 ක් වූ ණය ශේෂ 02 ක් අයවීමට පැවතුණි.

(උ) අභිගරු ජනාධිපතිතුමා විසින් අත්සන් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් වෙත එවා තිබූ දීමනා පත්‍ර 1636 ක් ලියාපදිංචි කර අදාළ හිමිකරුවන් වෙත භාරදී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(උ) හරිස්චන්ද්‍ර මාවත, අංක 04 ජ්‍යෙෂ්ඨ ලිපිකරු නිවාසයේ පදිංචි වී සිටි පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරිවරියක 2018 නොවැම්බර් 23 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් තිබුණු අතර 2022 සැප්තැම්බර් 09 දින විට එම නිලධාරිණිය විශ්‍රාම ගොස් වසර 04 කට ආසන්න කාලයක් ගත වී තිබුණද ඉහත නිවාසය විධිමත්ව පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ඵ) ගලෙන්බිදුනුවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මිය ගිය විශ්‍රාමිකයකු සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි විසින් ප්‍රමාද වී දැනුම් දීම හේතුවෙන් රු. 452,258 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඒ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සංවර්ධන නිලධාරි සංඛ්‍යාව 25 ක් වුවද, දැනට 68 දෙනකු සේවයේ යොදවා ඇති බැවින් 43 දෙනකු අතිරික්තයක් නිරීක්ෂණය විය.

(ඔ) වැඩ තහනමට ලක් වූ රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරියෙකු සහ සංවර්ධන නිලධාරියෙකු සම්බන්ධයෙන් මූලික විමර්ශන පවත්වා තිබූ නමුත් විධිමත් විනය පරීක්ෂණ පවත්වා අවසන් කර නොතිබුණි.

4 යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

(අ) කැකිරාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීම අරමුණු කරගෙන 2022.01.11 දින රු.100,000 ක මුදලක් ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය වෙතින් ලැබී පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. ස්ථිර නිවසක් නොමැති පූර්ණාබාධිත පුද්ගලයෙකු වෙත ගෙවීම සඳහා නිර්දේශ කර අනුමැතිය සඳහා නැවත ජාතික මහ ලේකම් කාර්යාලය වෙත 2022.04.26 දින යවා තිබුණද ඒ සඳහා අනුමැතියක් ලැබී නොතිබුණු බැවින් අදාල ප්‍රතිලාභියාට ආධාර ලබා දී නොතිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් තුරුවිල වැවේ වාන සැකසීමේදී යටවන ඉඩම්වලට වන්දි ගෙවීම සඳහා නාවිචාදුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 2015 දෙසැම්බර් 31 දින තැන්පත් කර තිබූ රු.613,721 ක මුදලක් 2022 නොවැම්බර් 11 දින වන විටත් 6000/0/0/17/0/21 පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණු අතර අදාල ප්‍රතිලාභීන් සඳහා එම වන්දි ලබාදීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

4.2 රාජ්‍ය ගිණුම් කාරක සභා නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2012 ජූනි 30 දින ලබාදී තිබූ නියෝග අනුව 2001-2006 කාලසීමාව තුළ වී මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් ලබාදුන් අත්තිකාරම් මුදලින් නවදුරටත් පියවිය යුතු ශේෂය රු. රු. 32,247,247 ක් විය.

5 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 25 ක් තෘතීයික මට්ටමේ පුරප්පාඩු 27 ක් ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 34 ක් පිරවීමටත් ද්විතීයික මට්ටමේ අතිරික්ත සේවකයින් 37 ක් සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියාකිරීමටත් කටයුතු කර නොතිබුණි.

ආර්.පී.චන්ද්‍රසිලක,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

ආර්.පී. චන්ද්‍රසිලක
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත්:- 01. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 02.
02. ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමුණුම 01

ප්‍රාදේශිය කාර්යාලය	ලේකම් කාලච්ඡේදය	රාජ්‍ය භාගය ගෙවූ කියුබ් ප්‍රමාණය	රජයේ ගස්තු ගෙවිය යුතු කියුබ් ප්‍රමාණය	රජයේ ගස්තු ගෙවූ කියුබ් ප්‍රමාණය	රජයේ ගස්තු නිහ කියුබ් ප්‍රමාණය	නිහ මුදල
						රු.
කැකිරාව	2020.06.15 2022.07.19	3,605.7	3,605.7	1,652.9	1,952.8	854,000
තිරප්පනේ	2020.03.12 2022.12.31	91,258.59	91,258.59	-	-	57,187,662
ගල්නෑව	2020.12.02 2022.03.21	-	-	-	-	508,440
නාච්චාදුව	2020.02.20 2023.01.23	36,360.53	36,360.53	11,685.67	24,674.86	21,054,390
මනුප	2021.01.18 2022.03.28	8,519.2	8,519.2	1,640.9	3,530.9	2,491,272
මිහින්තලේ	2020.07.03 2023.09.25	22,802.16	22,802.16	284.2	22,517.96	11,228,392
ගලෙන්බිදුණුවැව	2021.03.30 2022.03.29	4,236	4,236	1263.39	2,972.21	1,485,850
කහටගස්දිගිලිය	2020.10.12 2022.12.31	37,942.32	37,942.32	-	37,942.32	18,881,336
මැදවච්චිය	2020.03.11 2023.01.27	95,859.91	95,859.91	31,064.5	64,795.41	33,607,319
		300,584.41	300,584.41	47,591.56	158,386.46	147,298,661

ඇමුණුම 02

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	කවදුරටත් අයකරගැනීමට පවතින ණය මුදල් ප්‍රමාණය
	රු.
ඉපලෝගම	39,685
හොරොව්පොතාන	155,700
කහටගස්දිගිලිය	7,550
මැදවච්චිය	203,860
පලුගස්වැව	53,730
නිරප්පනේ	721,030
මහවිලච්චිය	229,755
මිහින්තලේ	284,660
තලාව	37,135
ම.නු.ප	245,470
නාච්චාදුව	43,003
ගලෙන්බිදුනුවැව	3,700
රඹෑව	2,000
පදවිය	28,500
ගල්නෑව	47,834
නැ.නු.ප	228,980
රාජාංගනය	250,300
පලාගල	250,300
	2,833,192

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
1. දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වන වැඩසටහන් නියමිත කාලය තුළ සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කටයුතු සිදුකිරීම	√		
2. දිස්ත්‍රික්කය තුළ පරිසරය හා ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා වන තීරණවලට එළඹීම සඳහා සියලු පාර්ශ්වයන් සමග සාකච්ඡා කිරීම, අවශ්‍ය තීරණ ක්‍රියාත්මක කිරීම	√		
3. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික්කය තුළ සිදුකරන ව්‍යාපෘතීන් හා කාර්යයන් අධීක්ෂණය හා පසුවිපරම් කිරීම	√		
4. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන හා මහජන සංවිධාන අධීක්ෂණය හා පහසුකම් සැපයීම	√		
5. රජය මගින් ප්‍රමුඛ අවධානය ලබාදී ක්‍රියාකරන විශේෂ ව්‍යාපෘති දිස්ත්‍රික් මට්ටමින් සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම	√		
6. E-Government සඳහා අවශ්‍ය වන පසුබිම සැකසීම		√	
7. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ සියලු රාජ්‍ය සේවකයින්ගේ ආයතන කටයුතු නිසි පරිදි සිදුවන බව තහවුරු කිරීම	√		
8. ප්‍රාදේශීය පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම	√		
9. දිස්ත්‍රික්කය තුළ සමාජ සුභසාධනය තහවුරු කිරීම	√		
10. දිස්ත්‍රික් කෘෂිකර්ම සැලැස්ම සැකසීම හා ක්‍රියාවට නැංවීම		√	
11. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින සියලු කාර්යය මණ්ඩලය නියමිත ආකාරයට පුහුණු කිරීම		√	
12. ඵලදායිතා සංකල්ප ප්‍රවර්ධනය හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම	√		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50-74%	75%-100%
දිස්ත්‍රික්කයේ පවතින දරිද්‍රතාව හා දිළිඳුකම අවම කිරීම ප්‍රමුඛ කරගත් ඒ වටා ඇති ගැටලු හා බාධක ඉලක්ක කරගත් යටිතල පහසුකම් සංවර්ධන කිරීම	I. අඩු ආදායම්ලාභීන් සඳහා සමාජ ආරක්ෂාව සහතික කිරීම II. මූලික සේවා සැපයුම ඉහළ නැංවීම III. සමාජීය, පාරිසරික ව්‍යසනයන් හා කම්පනයන්ගෙන් පීඩාවට පත්වීම අවම කිරීමට අදාළ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	ජීවනෝපාය ආශ්‍රිත ව්‍යාපෘති 46 ක් ක්‍රියාත්මක කිරීම	-	-	√
තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කරගත් ග්‍රාමීය පොදු යටිතල පහසුකම් සංවර්ධනය	2022 වර්ෂයේ අයවැය යෝජනා මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ග්‍රාමීය කමිටු හරහා හඳුනා ගබනු ලබන යෝජනා අතරින් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා පාදක වූ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	ග්‍රාමීය පොදු යටිතල පහසුකම් සංවර්ධනය ආශ්‍රිත ව්‍යාපෘති 428 ක් ක්‍රියාත්මක කිරීම	-	-	√
අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථිකය නංවාලීම සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 හි ම එක් වසමකින් 10 දෙනෙකු බැගින් පවුල් 6940 ක් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම	ගෙවතු වගාව තුළින් දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවීම මගින් වියදම් පාලනය	-	-	√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

2020 වර්ෂයේ අයවැය යෝජනා මගින් ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍ර 4ක් ඔස්සේ ප්‍රතිපාදන වෙන් විය. වෙන් වූ සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 4022ක් වන අතර වියදම් දැරීම කාර්තු පදනම මත සිදු කළ බැවින් වෙන් කල ප්‍රතිපාදන සඳහා පළමු කාර්තුව සඳහා පමණක් හඳුනා ගත් යෝජනා මත ව්‍යාපෘති 6690ක් ක්‍රියාත්මක විය. ඒ සඳහා අනුමත වූ ප්‍රතිපාදන වටිනාකම රුපියල් මිලියන 2782.97කි. එහෙත් මෙම වර්ෂයේ පැවති දේශපාලනික හා ආර්ථික ගැටලු මධ්‍යයේ මෙම වාර්ෂික වැඩසටහන අප්‍රේල් මාසයේ අත්හිටුවීමත් සමග සැලසුම් කල පරිදි අදාළ ඉලක්ක වෙත ළඟාවීමට නොහැකි විය.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

		අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	16	12	4
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	91	69	22
තෘතීයික	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	4	3	1
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	50	24	26
ද්විතියික	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	77	107	-30
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2249	2257	-8
ප්‍රාථමික	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	30	26	4
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	189	158	31

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ද්විතියික මට්ටමේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පුරප්පාඩු පැවැතීම හේතුවෙන් ආයතනයේ කාර්යය සාධනයට වන බාධාව සංවර්ධන නිලධාරී සේවයේ අතිරික්තය මගින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය රු.		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම *
			දේශීය	විදේශීය		
කාර්යාල ක්‍රම හා ගිණුම් කරණය	75	එක් දින	849,532.44		දේශීය	
මුදල් රෙගුලාසි	31	එක් දින				
ව්‍යාපෘති වාර්ථා සැකසීම හා ව්‍යාපෘති කළමණාකරණය	50	එක් දින				
ව්‍යාපෘති වාර්ථා සැකසීම	88	එක් දින				
පශ්චාත් උපාධි පාඨමාලාව	3					
ව්‍යාපෘති වාර්ථා සැකසීම	75	එක් දින				
කාර්යාල කළමණාකරන කාර්ය පටිපාටිය හා වැදගත්ලේඛන නඩත්තුව	53	එක් දින				
රජයේ කාර්යාලවල ප්‍රායෝගික ගිණුම් කටයුතු	77	එක් දින				
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන	2	දෙදින				
කාර්යාල කළමණාකරන පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන	40	එක් දින				
කාර්මික / තාක්ෂණ නිලධාරීන් සඳහා වූ පුහුණුව	53	එක් දින				
විනය කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණුව	72	එක් දින				
සත්කාරක කළමණාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	31	එක් දින				
ඉඩම් රාජකාරී පිළිබඳ පුහුණු වැඩසටහන	45	දෙදින				
උණුසුම් ඇදුම් දීමනාව		එක් දින				
පශ්චාත් උපාධි පාඨමාලාව	1			475,655.00	විදේශීය	

*

- ✓ පුහුණුව මගින් නව ශිල්පක්‍රම හා දැනුම හඳුනා ගැනීම හා ආයතනය තුළ ක්‍රියාත්මක කිරීම
- ✓ පුහුණුව තුළින් නිලධාරීන්ගේ ඵලදායීතාව ඉහල නැංවීම මගින් අරමුණු සාක්ෂාත් කර ගැනීම හා දැක්ම ළඟාකර ගැනීමට හැකිවීම
- ✓ ධාරිතා සංවර්ධනය තුළින් රාජකාරි කටයුතු කාර්යක්ෂමව හා ප්‍රශස්තව ඉටු කිරීම

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛනාගත කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි/පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීමපිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතලපවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම්සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	නැත	ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් තොරතුරු නොලැබුණු අවස්ථා තිබුණි.	ඉදිරියේදී නියමිත පරිදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇත.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAවක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	නැත	2020 පළමු හා අවසන් රැස්වීම් පවත්වා ඇත.	ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කිරීමට දැනුවත් කර ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	නැත	හිමිකම් නිරවුල් නොවීම	හිමිකම් නිරවුල් කිරීම සිදුකිරීම.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	1. රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PS/GT/2020(III වෙළුම) හා 2022.01.03 දිනැති ලිපිය අනුව අතිරික්තව සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් අතිරික්ත සේ නොසලකා කටයුතු කරන ලෙස දන්වා ඇත. 2.ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව පුරප්පාඩු සඳහා බඳවාගැනීම් කල් තැබීම හේතුවෙන් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනමට නොහැකි වීම	
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරතිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	නැත	සකස් කරමින් පවතී	නිශ්චිත වගකීම් පවරා පසු විපරම් කිරීම.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	නැත	සකස් කරමින් පවතී	නිශ්චිත වගකීම් පවරා පසු විපරම් කිරීම.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	**ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම.**	අනුකූල වේ		